2023 ජනවාරි

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවලට අනුව 2023 ජනවාරි මාසයේදී, සේවා ක්‍රියාකාරකම්වල සුළු වර්ධනයක් දක්නට ලැබුණු අතර, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පසුබෑමක් තවදුරටත් දක්නට ලැබුණි.**

**නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2023 ජනවාරි මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම්හි අඛණ්ඩ පසුබෑමක් පෙන්නුම් කරයි.** ඒ අනුව, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2023 ජනවාරි මාසයේ දී දර්ශකාංක 4.0කින් පහළ යමින් 40.8ක අගයක් වාර්තා කළ අතර, මේ කෙරෙහි ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය හැර අනෙකුත් සියලුම උප-දර්ශකයන්ගේ පහත වැටීම හේතු විය.

නව ඇණවුම් සහ නිෂ්පාදන පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයේ දක්නට ලැබුණු ඉල්ලුම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. දෙසැම්බර් උත්සව සමයෙන් පසුව සාමාන්‍ය පරිදි සිදුවන ඉල්ලුමෙහි පහත වැටීමට අමතරව, ප්‍රධාන වශයෙන් පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව පහත වැටීම හේතුවෙන් ඉල්ලුමේ සැලකියයුතු අඩුවීමක් දක්නට ලැබුණු බව ආහාර හා පාන වර්ග නිෂ්පාදනයේ යෙදෙන බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කර ලදී. ප්‍රධාන අපනයන ගමනාන්තයන්හි දක්නට ලැබුන ආර්ථික මන්දගාමීත්වය හේතුවෙන් විදේශීය ඉල්ලුම පහත වැටුණු බව බව රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදකයින් වැනි අපනයනාභිමුඛ නිෂ්පාදකයින් නිරීක්ෂණය කළ අතර එය ඔවුන්ගේ කර්මාන්තශාලා පූර්ණ ධාරිතාවයට වඩා සැලකිය යුතු අඩු ධාරිතාවයකින් යුක්තව පවත්වාගෙන යෑමට හේතු විය. තවද, නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු පහත වැටීමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිල දී ගැනුම් ද පහත වැටුණි. අමුද්‍රව්‍ය තොග ඉහල යාම නිසා තවදුරටත් තොග මිලදී ගැනීම් අඩුකළ බව බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී. මේ අතර, පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජනවාරි මාසයේ දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි විය.

| විචලයය | 2022 දෙසැ. | 2023 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **44.8** | **40.8** | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 45.5 | 38.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 40.5 | 37.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.5 | 41.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 41.9 | 35.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 53.0 | 55.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


වැය කළ හැකි අදායම පහත වැටීම හමුවේ වුවද, එළඹෙන උත්සව සමය වෙනුවෙන් ඉල්ලුම වැඩි වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ඉහළ යන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**40.8**

**2023 ජනවාරි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.4කින් ඉහළ යමින් 2023 ජනවාරි මාසයේ දී 49.1ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජනවාරි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සිංගප්පූරුවේ වැඩි වේගයකින් ද ඉන්දියාවේ සහ රුසියාවේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ චීනය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජනවාරි මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 පෙබරවාරි 14 වන දිනට*

---

[1] *එස්&පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 ජනවාරි මාසයේ දී 50.2ක දර්ශක අගයක් වාර්තා කරමින් කඩඉම් මට්ටමට මදක් ඉහළින් පැවතුණි.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ වර්ධනය හේතු විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, අධ්‍යාපන සහ දේපළ වෙළදාම් යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑමත් සමඟ, 2022 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2023 ජනවාරි මාසයේ දී නව ව්‍යාපාර වැඩි වේගයකින් වර්ධනය විය.

සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් 2023 ජනවාරි මාසයේ දී අඩු වේගයකින් අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, මූල්‍ය සේවා, අධ්‍යාපන සහ සන්නිවේදන යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, සංචාරක පැමිණීම්වල වැඩිවීමට සමගාමීව, අනෙකුත් පෞද්ගලික සේවා සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, උත්සව නොපැවැත්වෙන කාල සීමාව සහ පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩු වීම මධ්‍යයේ තොග හා සිල්ලර වෙළදාම උප අංශයට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් තවදුරටත් පහත වැටුණි. තවද, රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයට අදාළ බහාලුම් පරිමාවල පහත වැටීම හේතුවෙන් ප්‍රවාහන උප අංශය ද පහළ ගියේය.


සේවයෙන් ඉවත්වීම්, රැකියා සඳහා විදේශගත වීම් සහ විශ්‍රාම ගැනීම් හේතුවෙන් ජනවාරි මාසයේ දී සේවා නියුක්තිය වැඩි වේගයකින් පහළ ගියේය. නිමකිරීමට නියමිත කාර්යයන්ද වැඩි වේගයකින් පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**50.2**

**2023 ජනවාරි**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | 2022 දෙසැ. | 2023 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **51.6** | **50.2** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 52.0 | 56.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 54.0 | 51.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 45.5 | 39.4 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 47.4 | 44.1 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 59.0 | 60.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන්, එළඹෙන උත්සව සමය හේතුවෙන් තවදුරටත් වර්ධනය වූ අතර, ආර්ථික තත්ත්වය වර්ධනය වීම පිළිබඳ ධනාත්මක ආකල්ප ද මේ සඳහා හේතු විය. කෙසේ වෙතත්, සමහර ප්‍රතිචාර දක්වන්නන් විසින්, නව බදු ව්‍යුහයත් සමඟ මිලදී ගැනීමේ හැකියාව අඩු වීම සහ යෝජිත විදුලි ගාස්තු ඉහළ දැමීම, ඔවුන්ගේ ඉදිරි කටයුතු සඳහා අහිතකර ලෙස බලපානු ඇති බවට සඳහන් කර තිබුණි.

### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 දෙසැම්බර් මාසයේ පැවති 48.1 සිට 2023 ජනවාරි මාසයේ දී 50.1 දක්වා ඉහළ ගියේය.

චීනය, ඉන්දියාව සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 ජනවාරි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා ක්‍රියාකාරකම්වල පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 පෙබරවාරි 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.